පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක:- 2009/05

මගේ අංකය:- NCP/CS/PT/AP/04 පොදු
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2009.01.19

සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත.

**<u>රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ ණය දීම සහ දෙපාර්තමේන්තු අතර ණය ශේෂ නිරවුල් කිරීම.</u>**

දෙපාර්තමේන්තු අතර ණය ශේෂ නිරවුල් කිරීම සම්බන්ධව අනුගමනය කල යුතු ක්‍රියා පරිපාටිය පිළිබඳව මගේ අංක NCP/CS/PT/07/2002 හා 2002.12.09 දිනැතිව නිකුත් කරන ලද අංක NCP/2002/11 දරණ චක්‍රලේඛයෙන් උපදෙස් ලබා දී ඇතත් සමහර ආයතන මේ දක්වා ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර ඇති බවක් නොපෙනේ. මෙම කරුණ විගණන විමසුම් වලට තුඩු දී ඇති බැවින් පහත සඳහන් උපදෙස් නිකුත් කරනු ලැබේ.

01. 2009 වර්ෂයේ අත්තිකාරම් ගිණුම් වලින් ආපදා ණය ගෙවීමට ප්‍රථම පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ NCP/2002/11 ට අනුව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු වූ නිලධාරින්ට අදාළ ණය ශේෂ ගිණුම් සාරාංශ මගින් නිරවුල් කර ගැනීමට පියවර ගත යුතු අතර එම ණය ශේෂ නිරවුල් කරගන්නා තෙක් ආපදා ණය ගෙවීම සම්පූර්ණයෙන් නතර කල යුතුය.

02. පළාත් සභාවෙන් පිටත දෙපාර්තමේන්තු වලට ස්ථාන මාරු වී ගිය සහ ස්ථාන මාරු වී පැමිණි නිධාරින්ගෙන් අයවිය යුතු සහ ගෙවිය යුතු ණය ශේෂ ගණන් බලා ණය ශේෂ නිරවුල් කිරීමට අතිරේක මුදලක් අවශ්‍ය නම් ලැබිය යුතු හා ගෙවිය යුතු ණය ශේෂ පිළිබඳව විස්තර 2009.03.31 වන දිනට පෙර පළාත් භාණ්ඩාගාරයට දැනුම් දී එම අතිරේක මුදල ලබා ගැනීමට කටයුතු කල යුතුය.

03. වෙනත් පළාත් සභා වලින් හෝ මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු වලින් අයවිය යුතු ණය ශේෂ ඇත්නම් එම ණය ශේෂ 2009.06.30 දිනට පෙර ලබා ගැනීමට කටයුතු කල යුතුය. ඒ අනුව 2009

වර්ෂය වෙනුවෙන් පිලියෙල කරනු ලබන අවසාන ගිණුම් වල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු ණය ශේෂ හෝ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ගෙවිය යුතු ණය ශේෂ නොපෙන්වීමට වග බලා ගත යුතු වේ.

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පළාත් සභා අරමුදලින් වැටුප් ලබාගන්නා නිලධාරින් ඉතා සීමිත සංඛ්‍යාවක් ඇති බැවින් වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාම ඵලදායී නොවන බව පෙනී යයි. එබැවින් එම අත්තිකාරම් ගිණුම වසා දැමීමට හැකිවන පරිදි පහත සඳහන් පරිදි කටයුතු කල යුතුය.

**4.1.** ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින පළාත් සභා අරමුදලින් වැටුප් ලබන නිලධාරින්ගේ 2008.12.31 වන දිනට ඇති ණය ශේෂ අංක 60911 දරණ ප්‍රාදේශීය පාලනය වෙනුවෙන් ඇති අත්තිකාරම් ගිණුමට ගිණුම් සාරාංශ මඟින් පවරා දීමට කටයුතු කල යුතුය. එම නිලධාරින් 2009 වර්ෂයේ සිට ණය ඉල්ලුම් කරයි නම් එම ණය අයදුම්පත් 60911 දරණ ප්‍රාදේශීය පාලනය වෙනුවෙන් ඇති අත්තිකාරම් ගිණුමෙන් ණය ලබා දීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත යොමු කල යුතුය. එසේ ණය ලබාගත් නිලධාරින්ගෙන් මාසිකව අවකරණය කරනු ලබන මුදල චෙක්පතකින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත එවිය යුතුය.

**4.2.** පළාත් සභා වෙනුවෙන් ඇතිකර ඇති අත්තිකාරම් ගිණුමෙන් ණය ලබා ගත් නිලධාරින් දැනට මධ්‍යම රජයට අනුයුක්තව ඇත්නම් හා මධ්‍යම රජයේ අරමුදලින් වැටුප් ලබයි නම් එම නිලධාරින්ගේ 2008.12.31 වන දිනට ඇති ණය ශේෂ මධ්‍යම රජයට පවරා චෙක්පතකින් නිරවුල් කරගැනීමට කටයුතු කල යුතුය.

**4.3.** ඉහත පරිදි කටයුතු කිරීමෙන් අනතුරුව අත්තිකාරම් ගිණුම වසා දැමීම සඳහා 2009 ජුනි 30 දිනට පෙර මීට අමුණා ඇති ආකෘතියට අනුව ඉල්ලීමක් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. මේ පරිදි කටයුතු කිරීම සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) එකඟත්වය ලබා දී ඇත.

05. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් වලට අදාළව 2007 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කර නැති කාර්යාල වල ආපදා ණය ගෙවීම් පමණක් (විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් හැර) ගිණුම් සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරන තෙක් අත්හිටුවනු ලැබේ.

06. මෙම චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කිරීමේදී යම් සීමා සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පළාත් සභා රීති සංග්‍රහයේ විධිවිධාන වලට අනුව සීමා සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුය.

**02**. මෙම චක්‍රලේඛය ලද බවත්, ඒ අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බවත්, දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

**ඒ.තලාකොටුනගේ,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත:- 01. විගණකාධිපති - දැ.පි

මගේ අංකය:-.................................................

දිනය:-..........................................................

ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

## අත්තිකාරම් වසා දැමීම සඳහා ඉල්ලීමයි.

01.අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය:-..........................................................................

02.අත්තිකාරම් ගිණුම් අංකය:-..............................................................................................................

03.අත්තිකාරම් ගිණුම් නාමය:-..............................................................................................................

04.ගණුදෙනු අවසන් කළ මාසය:-.............................................................................................................

05.අත්තිකාරම් ගිණුම් අක්‍රියව පැවති කාලය:-.................................................................................

06.ගිණුම් වසා දැමීමට හේතුව:-..............................................................................................................

07.ගිණුම් වසා දමන අවස්ථාව වන විට:-

7.1.ණයගැති ශේෂ වල එකතුව:-....................................................................................................

7.2.ණයහිමි ශේෂ වල එකතුව:-..................................................................................................

7.3.වෙනත් වත්කම් වල එකතුව:-.................................................................................................

7.4.වෙනත් බැරකම් වල එකතුව:-..................................................................................................

08. පහත සඳහන් ලියවිලිද මේ සමඟ ඉදිරිපත් කරමි.

8.1.ගිණුම ක්‍රියාත්මක වූ අවසාන මාසයට අදාළ අත්තිකාරම් ගිණුමේ මාසික වාර්තාවේ පිටපතක් (භාණ්ඩාගාරය සැසඳීම් කළ පසුව)

8.2.අවසන් වරට පිළියෙල කළ අත්තිකාරම් ගිණුමේ පිටපතක්

8.3.අවසන් වරට පිළියෙල කළ අවසාන ගිණුමෙන් පසු ගණුදෙනු නැති බවට සහතිකයක්

මේ අනුව උක්ත අත්තිකාරම් ගිණුම වසාදිමීම සුදුසු බව නිර්දේශ කරමි. ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

දිනය:-....................................

.............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

නිර්දේශ ඉදිරිපත් කරමි.

දිනය:-....................................

.............................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන
(නිල මුද්‍රාව)